සුරාබදු කොමසාරිස් ජනරාල්
ஆணையாளர் நாயகம்
Commissioner General
} 3888022
3888023

අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් (ආදායම් ප්‍රතිපත්ති හා පාලන)
மேலதிக ஆணையாளர் நாயகம் (வருமானக் கொள்கை, நிர்வாகம்))
Additional Commissioner General (Revenue Policy & Admin)
} 2045050

අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් (ආදායම් මෙහෙයුම් හා නීති ක්‍රියාත්මක කිරීම්)
மேலதிக ஆணையாளர் நாயகம் (வருமான முகமைத்துவம், சட்டவலுப்படுத்தல்)
Additional Commissioner General (Revenue Management&Law Enforcement)
} 2877891

ෆැක්ස්
பெக்ஸ்
Fax
} 2877890

ඊමේල්-
மின்னஞ்சல்
E-Mail
} excisen@slt.lk

දුරකථන අංකය
தொலைபேசி எண்.
Telephone No
} 2045000


# ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
# இலங்கை மதுவரித் திணைக்களம்
# EXCISE DEPARTMENT OF SRI LANKA


අංක 353, කෝට්ටේ පාර, රාජගිරිය இல.353,கோட்டை வீதி,இராஜகிரிய.No 353, Kotte Road, Rajagiriya.


මගේ අංකය. / எனது இல: / My No. } ED/02/2/කා.ක.විභාග(පොදු)

ඔබේ අංකය. / உமது இல: / Your No. }

දිනය / திகதி / Date } 2022.09.14

සු.කො./නි.සු.කො./ස.සු.කො./සු.අධිකාරි/
සුරාබදු ස්ථානාධිපතිවරුන් මඟින්
සුරාබදු සැරයන් හා නියාමකවරුන් වෙත

**ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු සැරයන් හා සුරාබදු නියාමක තනතුරුවලට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා ඉල්ලුම් පත් කැඳවීම - 2022 දෙවන භාගය**

සුරාබදු සැරයන් හා නියාමකවරුන් වෙනුවෙන් 2022 දෙවන භාගයේ පැවැත්වීමට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවීමට තීරණය කර ඇත.

02. මෙම විභාගයට අදාල ලිඛිත පරීක්ෂණය ශ්‍රී ලංකා පදනම් ආයතනය විසින් ද වාචික පරීක්ෂණය සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් ද පවත්වනු ලැබේ.

03. මෙම විභාගය සඳහා අනුගමනය කරන විභාග පරිපාටිය පහත දැක්වේ.

3.1 සුරාබදු නියාමක පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

| විෂය අංකය | විෂයය | විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|---|
| 01 | සුරාබදු නීතිය (ලිඛිත) | සුරාබදු ආඥාපනත, වස විස, අබිං සහ අන්තරාදායක ඖෂධ ආඥාපනත ඇතුළත් සුරාබදු අත්පොත | පැය 03 | 100 | 40 |
| 02 | පරිපාලන නීතිය (ලිඛිත) | i. දෙපාර්තමේන්තු නියෝග ඇතුළත් සුරාබදු අත්පොත 1 වැනි කොටස<br>ii. සුරාබදු නියාමක අත්පොත<br>iii. ආයතන සංග්‍රහයේ පළමු කාණ්ඩයේ V, VI, XII, XIV පරිච්ඡේද<br>iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහය<br>v. මුදල් රෙගුලාසි සංග්‍රහයේ 104, 165 සිට 170, 175 සිට 178, 182 සිට 184, 200 සිට 205, 315, 320, 340 | පැය 03 | 100 | 40 |
| 03 | සී වාචික පරීක්ෂණය | සිංහල/දෙමළ කතා කිරීමේ හා තේරුම් ගැනීමේ හැකියාව මැනීම | - | 100 | 40 |

3.2 සුරාබදු නියාමක/ සුරාබදු සැරයන් දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා විෂය නිර්දේශය

| විෂය අංකය | විෂය | විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|---|
| 01 | සුරාබදු නීතිය (ලිඛිත) | සුරාබදු ආඥාපනත, වස විස, අබිං සහ අන්තරාදායක ඖෂධ ආඥාපනත, දෙපාර්තමේන්තු නියෝග හා සුරාබදු නිවේදන | පැය 03 | 100 | 40 |
| 02 | මූලික නීතිය (ලිඛිත) | නීතිය, අපරාධ නඩුවිධාන සංග්‍රහය, ලංකා දණ්ඩනීති සංග්‍රහය හා සාක්ෂි ආඥාපනත සම්බන්ධව දෙපාර්තමේන්තු නියෝග 378 හි සඳහන් විෂය නිර්දේශය | පැය 03 | 100 | 40 |

04 . අයදුම් පත්‍ර ඉදිරිපත් කිරීම :-

මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව අපේක්ෂකයින් විසින් ස්වකීය අයදුම් පත්‍රය පිළියෙල කරගත යුතුය.

ඒ අනුව, පිළියෙල කරන ලද අයදුම් පත්‍රය අපේක්ෂකයින් විසින් අදාළ අධීක්ෂණ නිලධාරීන් මගින් **2022.10.17** වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ සුරාබදු කොමසාරිස් ජනරාල් වෙත ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව, නො.353, කෝට්ටේ පාර, රාජගිරිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. **ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය.** අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

4.1 විභාග ගාස්තු :-

(අ) පළමු වතාවට සම්පූර්ණ විභාගය සඳහා හෝ කොටසක් සඳහා ගාස්තු අය නොකෙරේ.

(ආ) ඉන් පසු එක් එක් වතාවකට සම්පූර්ණ විභාගය සඳහා විභාග ගාස්තුව රු.500.00 කි.

(ඇ) එක් විෂයකට පමණක් පෙනී සිටීම සඳහා විභාග ගාස්තුව රු.200.00 කි.

05. යම් අපේක්ෂකයෙකු අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැතිව විභාගයට ඉදිරිපත් වුවහොත් ඔහුගේ /ඇයගේ ප්‍රතිඵල වලංගු සේ පිළිනොගැනේ.

06. සුදුසුකම් ලත් විභාග අපේක්ෂකයින්ට විභාග අංකය,විභාගය පැවැත්වෙන දිනය හා වේලාව අයදුම්පත්වල සඳහන් රාජකාරි ලිපිනය අනුව දැනුම් දෙනු ලැබේ. ලිපිනයේ වෙනසක් සිදුවුවහොත් කල් ඇතිව ඒ බව මා වෙත දැනුම් දිය යුතුය.

**එම්.ජේ. ගුණසිරි**
සුරාබදු කොමසාරිස් ජනරාල්

පිටපත්:-1. ප්‍රධාන ගණකාධිකාරි - කරු.දැ.ගැ.ස.

2. සියලුම සහකාර සුරාබදු කොමසාරිස්වරුන්/සුරාබදු අධිකාරිවරුන් -

විභාග අපේක්ෂකයින් විසින් විභාග ගාස්තු වශයෙන් ගෙවන ලද මුදල් වෙනුවෙන් පොදු 172 ලදුපතක් නිකුත් කළ යුතු අතර එසේ එකතු වන මුදල් ලංකා බැංකුවේ තැප්‍රෝබේන් ශාඛාවේ අංක 0007041628 දරණ සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ ගිණුමට බැර කර අදාළ විස්තර 2022.10.17 දිනට පෙර ප්‍රධාන ගණකාධිකාරී වෙත වාර්තා කළ යුතුය.

ආදර්ශ අයදුම් පත්‍රය

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු සැරයන්/ සුරාබදු නියාමක නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2022 දෙවන භාගය

EFFICIENCY BAR EXAMINATION FOR EXCISE SERGEANTS/ EXCISE GUARDS OF THE EXCISE DEPARTMENT OF SRI LANKA – 2022 FIRST SEMESTER

01. අයදුම් කරනු ලබන කාර්යක්ෂමතා කඩඉම : ......................................................

02. විභාගයට පෙනී සිටින මාධ්‍යය

සිංහල - 2 [ ]

දෙමළ - 3

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

[ ] (කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

03. (අ) අගට යොදන නම (මුලකුරු සමඟ)

i. සිංහලෙන්:..............................................................................................................

ii. ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්:..............................................................................................

(උදා:GUNAWARDHANA, M.G.B.S.K.)

(ආ) මුල් අකුරුවලින් හැඳින්වෙන නම

i. සිංහලෙන්:..............................................................................................................

ii. ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්:..............................................................................................

04. කාර්යාලයීය ලිපිනය

i. සිංහලෙන්:..............................................................................................................

ii. ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්:..............................................................................................

05. ස්ත්‍රී / පුරුෂ භාවය:

පුරුෂ - 0

ස්ත්‍රී - 1 [ ] (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

06. ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | | | ]

07. (අ) තනතුරට පත් වූ දිනය :-

වර්ෂය: [ | | | ] මාසය: [ | ] දිනය: [ | ]

(ආ) සු.නි./ සු.සැ. අංකය : ..............................

08. විභාගයට ඉදිරිපත් වන විෂයන්:-

| ඉල්ලීම් කරන විෂයය | විෂය අංකය |
|---|---|
| ...................................................................................... | |
| ...................................................................................... | |
| ...................................................................................... | |

09. මීට පෙර මෙම විභාගයට මුළුමනින්ම හෝ කොටසක් වශයෙන් හෝ පෙනී සිට ඇත්දැයි සඳහන් කරන්න. පෙනී සිට ඇත්නම් විෂයයන්, වර්ෂය හා මාසයද සඳහන් කරන්න.

| පෙනී සිටි විෂයය | විෂය අංකය | වර්ෂය | මාසය |
|---|---|---|---|
| ................................ | .......................... | ..................... | .................. |
| ................................ | .......................... | ..................... | .................. |
| ................................ | .......................... | ..................... | .................. |

10. ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉල්ලා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට මට හිමිකම ඇති බවත්, ප්‍රකාශ කරමි. ප්‍රථම වතාවට මෙම විභාගයට පෙනී සිටින බව/ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවන බැවින්, අදාළ විභාග ගාස්තුව ගෙවන ලද බවත්, ඊට අදාළ ලදුපත අමුණා ඇති බවත්, ප්‍රකාශ කරමි. (අදාළ නොවන වගන්තිය කපා හරින්න) විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් ගනු ලබන තීරණවලට මම යටත් බව ද ප්‍රකාශ කරමි.

11. විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම්,

i. ගෙවන ලද විභාග ගාස්තුව:........................................ ii.ගෙවූ දිනය:................................................

iii. ගෙවූ කාර්යාලය: ..................................................... iv. ලදුපත් අංකය:.........................................

| ලදුපත එක් දාරයකින් මෙහි අලවන්න<br><br>(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.) |
|---|

...................................................
අපේක්ෂකයාගේ අත්සන

දිනය:.............................

12. අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන සහතික කිරීම.

සුරාබදු කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරමි.

මෙහි විස්තර දැක්වෙන අපේක්ෂකයාට/ අපේක්ෂිකාවට, ඔහු/ඇය දක්වා ඇති මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, නියමිත විභාග ගාස්තු ගෙවූ ලදුපත මෙහි අලවා ඇති බවත්, සහතික කරමි.

.................................................................
අංශ ප්‍රධානියාගේ අත්සන

දිනය:.............................